




# තරු ලකුණක සොඳුරු මිහිර



සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

"ජපන් සාහිත්‍යයෙහි ෂේක්ස්පියර් වසයෙන් හඳුන්වනු ලබන චිකමත්සු නම් නාට්‍ය කරුවා, කාව්‍ය ගැන ඉතා වැදගත් මතයක් පවසයි......" බේදජනක දෙයක් සම්බන්ධයෙන්, 'එය බේදජනකය'යි කිවහොත්, එයින් කිසිවක් ධ්වනිත නොවේ. එයින් එය කිසිවකුගේ සිත තුළ කා-වදින්නේ නැත. කිසියම් දෙයක් 'බේදජනකය'යි කීමට වඩා ඒ දෙයම බේදජනක වුවහොත් මැනවි. ඒ දෙය බේදජනක ලෙස ඉදිරිපත් කළ යුතුය......... කෙලින් කිසිවක් නොකියා වක්‍රෝක්තියෙන් පැවසුව මනාය. කවර දෙයක් ගැන වුවද එසේමය." කාව්‍යයක හෝ කලා නිර්මාණයක 'සංයමයක්' තිබිය යුතු යයි කියන්නේ මේ අදහසින්ය. . ..
( එදිරිවීර සරච්චන්ද්‍ර, කල්පනා ලෝකය, 74, 75 පිටු)

උක්ත පාඨයෙහි අන්තර්ගත කරුණු සලකා බලන විට, විශේෂයෙන්ම කාව්‍ය නිර්මාණයක තිබිය යුතු ඇතැම් ලක්‍ෂණ පැහැදිලි කරගත හැකිය. කාව්‍ය රචනාවක විය යුත්තේ විවිධ දේ වාර්තාගත කිරීමක් නොවේ. නිර්මාණ කරුවාට පාඨකයා වෙත ලබා දිය යුතු දේ සැබවින්ම හැඟෙන, දැනෙන අයුරින් ප්‍රාණවත් ලෙස ඉදිරිපත් කිරීමයි. එම කාර්යයේදී කවියාගේ දක්‍ෂතාව මතු වී පෙනෙනුයේ සංයමයෙන් යුතුව සිය රචනාව පාඨකයා වෙතට සමීප කරවන ආකාරයෙනි.

සිංහල කාව්‍ය සාහිත්‍යය එදා මෙදාතුර විවිධ ශෛලීන් හා සම්ප්‍රදායයන් ඔස්සේ ඉදිරියට ගමන් කොට ඇත. සීගිරි ගීවල පටන් විකාශනය වී තිබෙන සිංහල පද්‍ය සාහිත්‍යය දිගු ඉතිහාසයකට හිමිකම් කියයි. මීට අඩ සියවසකට වැඩි කාලයක් තුළ වැඩී වර්ධනය වෙමින් පැවත එන "නිදහස් කාව්‍ය" අදටත් වලංගු මෙන්ම ලේඛක, රසික දෙපාර්ශ්වයේම අවධානයට ලක් වූ සම්ප්‍රදායක්ද වෙයි.

කවියක වැඩියෙන් වැදගත් වන්නේ ආකෘතිය නොව අනුභූතිය බව අද පිළිගැනෙන මතයයි. මෙහි වඩාත් පැහැදිලි අරුත වන්නේ අනුභූතියට ගැළපෙන ආකෘතියකින් කාව්‍ය නිර්මාණයක් සිදු විය යුතු බවයි. කිසියම් ලේඛකයකු සිය පද්‍ය නිර්මාණය සඳහා, එහි අනුභූතියට යෝග්‍ය වන අන්දමේ ආකෘතියක් තෝරාගත යුතු වෙයි. අනික් අතට ආකෘතිය විසින් අනුභූතිය තීරණය කරනු ලැබීමක් සිදු විය යුතු නොවන්නේය. සිංහල කාව්‍ය හා ගීත සාහිත්‍යය ඔපවත් කළ නිර්මාණ කරුවකු වන රත්න ශ්‍රී විජේසිංහ කවියා, 'බිය නොවන් අයියණ්ඩි' යන කෘතියෙහි සඳහන් කරන, මතු දැක්වෙන අදහස මෙය තහවුරු කරයි.

"කවිය, සාම්ප්‍රදායික සඳැස හෝ නිසඳැස හෝ විය හැකිය. කවියේ බාහිර හැඩරුව . එනම්, කාව්‍ය ආකෘතිය ප්‍රධාන නොවේ. වැදගත් වන්නේ කවියාගේ මූලික අත්දැකීම හා විඳීම, කවිය පරිහරණය කරන්නා තුළ ද එලෙසින්ම ඇති කිරීමට සමත්, සුදුසුම ආකෘතිය තෝරාගැනීමයි."
(රත්න ශ්‍රී විජේසිංහ, බිය නොවන් අයියණ්ඩි)

රත්න ශ්‍රී විජේසිංහ කවියා දරන මෙම අදහස් සැබවින්ම ඔහුගේ නිර්මාණ මගින් ද එළිදැක්වී ඇත. සම්මානලාභී විශිෂ්ට ලේඛකයකු වන රත්න ශ්‍රී විජේසිංහ විසින් රචිත කාව්‍ය, ගීත හා වෙනත් කෘති රාශියකි. 'බිය නොවන් අයියණ්ඩි', 'වස්සානේ', 'සුබ උදෑසන', 'සල් ගහ යට', 'මධ්‍යම යාමය', 'සන්ධ්‍යා තීර්ථය', 'තරු ලකුණ' ආදී කාව්‍ය සංග්‍රහ සමූහය මෙන්ම, 'වංක ගිරිය අරණේ', 'සුදු නෙළුම්', 'ගංගා ගීතය', 'ඉරබටු තරුව', 'නෙත නිලුපුල්', 'ආලකමන්දා', 'නිකිණි වැස්ස' ආදී ගීත සංග්‍රහ ද මෙම නිර්මාණ කරුවා කාව්‍ය හා ගීත සාහිත්‍යයට දැක්වූ පුළුල් දායකත්වය පෙන්නුම් කරයි.

වසර 1979 දී පළ වූ 'බිය නොවන් අයියණ්ඩි' පද්‍ය සංග්‍රහය මගින් රත්න ශ්‍රී විජේසිංහ රසවත් මෙන්ම අර්ථවත් වූ ද කවි සංකල්පනා රැසක් රසිකයා වෙතට ඉදිරිපත් කර ඇත. රට තුළ වරින් වර උද්ගත වන සමාජ.ආර්ථික හා දේශපාලන ගැටලු කෙරෙහි අතිශය සංවේදී හැඟීම් පළ කරමින් ඔහු කළ නිර්මාණ සැබවින්ම සාහිත්‍යමය වටිනාකමට සාමාජික අර්ථ දැක්වීම් ද එක් කරන ප්‍රබල නිර්මාණ වී ඇත.

"මගෙ බිසවුනේ
අසාපන්
නුඹ මන්ත්‍රී දේවි නොවුණේ
මේ කඳුළු ඇයිද දෑසේ
බෑ යන්ඩ නුඹට හිමයේ
විෂ ඝෝර සර්ප භවනේ
නවතින්න කෑලී නිවසේ
මේ කර්ණ කටුක නගරේ"
('වංකගරියට මාරු වීම', වස්සානේ පද්‍ය සංග්‍රහය, 1985)

කවියක සතු නිර්මාණ ශක්තිය සමගම සමාජ නිරීක්‍ෂණයෙන් ලබාගත් විචාරාත්මක දර්ශනය ද කාව්‍ය කෘතියකට වැඩි වැදගත් කමක් ලබා දෙන බවට රත්න ශ්‍රී විජේසිංහ කවියාගේ නිර්මාණ දෙස් දෙයි.

"ගිනිගත් මන්දිරවල
වාචාල කපුටන්ට
පුම්බාගත් සෙබඩුන්ට
රත්තරන් බිත්තර මිස
අම්මාවරුන් කුමටද?"
('මවු නැති මවු බිම', සුබ උදෑසන, 1988

රත්න ශ්‍රී විජේසිංහ කවියා මෙලෙසින් කාව්‍ය රසය සොයා ගොස් එය සහෘදයන් වෙත ද දයාවෙන් බෙදා දුන් අගනා ලේඛකයෙකි. ඒ සමගම සිය නිර්මාණ කියවන රසිකයන් ඒවායින් රසාස්වාදය ලබන අතරම තම දෑස්, දෙකන් යොමු කොට අවට සමාජය දෙස බලන්නට ද ඔවුන් නැඹුරු කරවීමට සමත් වූ නිර්මාණ කරු-වෙකි. කවර අන්දමේ හෝ තම අත්දැකීම්වලින් ජනිත වන කවි සංකල්පනාවන් රසික සමාජය වෙත ගෙන යා යුත්තේ රසය, දැනුම මෙන්ම අවබෝධය ද ඇති කරලමිනි. මෙම කවියා, වසර 1997 දී පාඨකයාට දායාද කළ අතිශය සුන්දර මෙන්ම රසවත් වූ ද කෘතියක් වන 'තරු ලකුණ' ඔහුගේ නිර්මාණ කාර්යයෙහි උපරිම තලයක රැඳී ඇතැයි කීම අසාධාරණ නොවේ. මෙම කෘතියෙහි දක්නට ලැබෙන තවත් විශේෂත්වයක් වනුයේ එය ආඛ්‍යාන කාව්‍ය කෘතියක් වීමයි.

'තරු ලකුණ' කාව්‍ය කෘතිය මගින් කතුවරයා පාඨකයාට රසය, සුන්දරත්වය මිහිරි ලෙස විඳගන්නට මග පාදා දෙයි. 'තරු ලකුණ' කාව්‍ය කෘතියට පෙරවදනක් එක් කරන කරුණාරත්න අමරසිංහ මහතා සඳහන් කරන පරිදි, මහගම සේකර නම් වූ විශිෂ්ට ලේඛකයා, රත්න ශ්‍රී විජේසිංහ පද්‍ය රචනයට පිවිසි මුල් අවදියේම ඔහු ගැන බලාපොරොත්තු තබා ඇත.

"සේකර විසින් හොඳ අනාගතයක් පිළිබඳ බලාපොරොත්තු තබන ලද, ඔහුගේම වචන අනුව අර, 'හොඳට කවි ලියන හාදයා . . .' " අනෙකකු නොව රත්න ශ්‍රී විජේසිංහ නම් තරුණ කවියාය. 'තෙල්ලඹුරේ රත්න ශ්‍රී විජේසිංහ' නමින් පූර්ව අවදියේදී හැඳින්වීමට ලක් වුණු රත්න ශ්‍රී, අද සිටින උසස් තත්වයට පත් වන්නට පෙර ආරම්භයේදී ලද දුක්බර අත්දැකීම් ඔහු විසින්ම කරුණාරත්න අමරසිංහ මතාට යවන ලද ලිපියක සඳහන් වී ඇත්තේ මෙසේය. ". . . . මා පද්‍ය නිර්මාණය කරන්නට උත්සාහ කළේ කුඩා අවදියේ සිට. පුවත්පත්වල ද ඇතැම් විට මගේ පද්‍ය සමහරක් පළවුණා. එහෙත් එහිදී ද ප්‍රතික්ෂේප වී නොසැලකිල්ලට බඳුන් වූ සංඛ්‍යා-වයි, අධික . . ."

'හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ' යන කියමන සනාථ කරමින් නූතන සිංහල කාව්‍ය ක්ෂෙත්‍රයෙහි රත්න ශ්‍රී විජේසිංහ කවියා උසස්ම පෙළෙහි සි-ටුවීමට සුදුසු තත්වයකට පත්ව ඇත. ඔහුගේ නිර්මාණ අතර ඉතා සාර්ථක හා රමණීය පද්‍ය මෙන්ම ගීත රචනා ද බහුලව ඇත. ඒ අතුරෙන් සැබවින්ම 'තරු ලකුණ' රසිකයා වෙත සුන්දර වූත් මිහිරි වූත් රසයක් ලබා දෙන්නකි. කතුවරයා දක්වන පරිදිම 'ආඛ්‍යාන කාව්‍ය' ගණයෙහි ලා ගත හැකි මෙම නිර්මාණ කෘතිය පුරාම ජීවිතය, මනුෂ්‍යත්වය, සමාජ ගැටලු, දුක සහ සැප එකට මුසුව ගැබ් වී ඇත.

"ලොතරැයි වාසනාවට
බැරැඞ්ව ගිය කටහඬ
හඳුනාගන්නට පවා
බැරි වූයේය සුරත්ට
හතරේ පන්තියේ හිටි
දක්‍ෂතම සිසුවා නුඹ
ලොතරැයි වෙළෙන්දා
දුක් සැප කුමක්ද?"
(තරු ලකුණ, 74, 75 පිටු)

සාහිත්‍යය යනු සමාජ පිළිබිඹුවකි, සමාජය පිළිබිඹු කරන කැඩපතකි. එසේ නම් එවැන්නක් මගින් සිදු විය යුත්තේ ද සමාජය විනිවිද දැකීමකි. එහි අහු මුලු සිසාරා යමින් දුක් වේදනා මෙන්ම සතුට ද දනවන කවි සංකල්පනා රසිකයා වෙතට ගෙන එන්නට රත්න ශ්‍රී කවියා සමත් වී ඇත.

කවියකු හෝ අන් කවර සාහිත්‍ය කරුවකු වුවද සමාජය වෙතින් තමා දකින, තමාට නිරීක්‍ෂණය කළ හැකි වන යථාර්ථය සිය නිර්මාණය මගින් ප්‍රතිනිර්මාණය කළ යුතුය. කරුණාරත්න අමරසිංහ මහතා 'තරු ලකුණ' කාව්‍ය කෘතිය ගැන සිය අදහස් දක්වමින් මෙසේ ද පවසයි. " රත්න ශ්‍රී විජේසිංහ තමා දුටු වත්මන් විපත තම 'තරු ලකුණ' කාව්‍යය මගින් අප සිත් සතන් වෙත ගෙන එන්නේ බණක් අණක් ලෙස නම් නොවෙයි. මලකින් විහිදෙන සුවඳක් වාගෙයි. ඒ සුවඳ අප ඇතුළු සිතට ඇතුල් වන්නේ සෙමින් ඇදී එන මඳ නලක් වන් ඔහුගේ කවි දහර වැලඳ ගෙනයි. තම හැඟීම් හා සිතුම් කවි බසින් පැවසීමෙන් දිගු කලක් තිස්සේ ලත් පුරුදු කම් වගේම අපූර්ව කවි චින්තා මැවීමේ ජන්ම වාසනාවත් හිමි රත්න ශ්‍රී විජේසිංහ අතේ 'තරු ලකුණ' කවි බසත්, පැවසුම් විදිත් මෝරා පුබුදු කවි මගක අඟ පසඟ බවට පත් වෙලා . . . ."
(තරු ලකුණ, 18, 19, පිටු)

බෙහෙවින් සාධාරණ අදහස් පළ කර ඇති මෙවන් විචාරයක් මගින් රත්න ශ්‍රී කවියාගේ